පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත.
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

| ශ්‍රේණිය |
|---|
| 06 |

# දෙවන වාර පරීක්ෂණය - 2019
# කතෝලික ධර්මය

පාසලේ නම : ..............................................................................................

ශිෂ්‍ය ශිෂ්‍යාවගේ නම/ඇතුළත්වීමේ අංකය : ...............................................
.................................................................................................................. කාලය : පැය 02 යි.

## I කොටස

**සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

- **නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01. කිතුනු අපගේ ජීවිතයේ විශ්වාසයේ හා බලාපොරොත්තුවේ පදනම වන්නේ,
(1) ශුද්ධ වූ පවුල යි. (2) දේව ප්‍රේමය යි. (3) නව ගිවිසුම යි. (4) ශුද්ධ බයිබලය යි.

02. නික්මයාම පොතේ ප්‍රධාන චරිතය ලෙස දැක්විය හැක්කේ,
(1) පාරාවෝ ය. (2) ආරොන් ය. (3) මෝසෙස් ය. (4) ජෝෂුවා ය.

03. මෙතුමා ජේසුස් වහන්සේගේ අපෝස්තුළුවරයෙකි. කැඳවීමට පෙර අයකැමියෙකි.
(1) ශුද්ධ වූ මතෙව් තුමා (2) ශුද්ධ වූ මාක් තුමා
(3) ශුද්ධ වූ ලූක් තුමා (4) ශුද්ධ වූ ජොහාන් තුමා

04. දෙවියන් වහන්සේ තමන් මවා වදාළ සියලු දේ නරඹා එය ඉතා .......... බව දුටු සේක. මෙහි හිස්තැනට සුදුසු වචනය වන්නේ,
(1) සුන්දර (2) මනහර (3) අලංකාර (4) අද්විතීය

05. ''විපුල ප්‍රසාද ලත් උත්තමිය ඔබට මංගල වේ. ස්වාමින් වහන්සේ ඔබ සමග ය.'' මෙසේ ප්‍රකාශ කළේ,
(1) ගාබ්‍රියෙල් දේව දූතයා ය. (2) සිමියොන් තුමා ය.
(3) ස්නාවක ජොහාන් තුමා ය. (4) සෙකරියස් තුමා ය.

06. දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ස්ථාපිත කරන ලද්දේ,
(1) මහා බ්‍රහස්පතින්දා ය. (2) පාස්කු ඉරිදා ය.
(3) මහා සිකුරාදා ය. (4) අළු බදාදා ය.

07. ආරම්භක දේව ප්‍රසාද නිධානයක් **නොවන්නේ,**
(1) සමඟි සන්ධානය යි. (2) ප්‍රසාද ස්නාපනය යි.
(3) අභිවෘද්ධි ආලේපය යි. (4) දිව්‍ය සත්ප්‍රසාදය යි.

08. ආශිර්වාදකාර බන්ධනය දේව ප්‍රසාද නිධානයක තත්ත්වයට උසස් කරන ලද්දේ,
(1) දෙවියන් වහන්සේ ය. (2) ජේසුස් වහන්සේ ය.
(3) පූජා ප්‍රසාදි තුමා ය. (4) විවාහ වන යුවල ය.

09. මෝසෙස් තුමා දස පනත ලබා ගැනීමට පෙර දින ....... ක් යාච්ඤා කළේ ය. මෙහි හිස්තැනට යෝග්‍ය පිළිතුර තෝරන්න.
(1) 20 (2) 50 (3) 10 (4) 40

10. දෙව් මවුන්ගේ නිර්මල පිළිසිඳීමේ මංගල්‍යය පවත්වනු ලබන්නේ,
(1) දෙසැම්බර් 8 ය. (2) අගෝස්තු 15 ය.
(3) ජනවාරි 1 ය. (4) සැප්තැම්බර් 8 ය.

(ලකුණු 2X10=20)



Education NCP - www.edncp.lk

- **ගැලපෙන පරිදි යා කරන්න.**

| | A | B |
|---|---|---|
| 11. | සැබෑ වූ එකම දෙවිඳුන්ට පමණක් වන්දනා කිරීම | තුන්වන පනත |
| 12. | සෑම ඉරු දිනකම දිව්‍ය පූජාවට සහභාගී වීම | හතරවන පනත |
| 13. | වැඩිහිටියන්ට ගරු කිරීම | පළමු පනත |
| 14. | සෑම ජීවිතයකටම ආදරය කිරීම | අටවන පනත |
| 15. | සත්‍යවාදීව කටයුතු කිරීම | පස්වන පනත |

(ලකුණු 2X5=10)

- **පහත සඳහන් වාක්‍ය හරි නම් ✓ ලකුණ ද වැරදි නම් × ලකුණ ද වරහන් තුළ යොදන්න.**

16. පූප හා මිදි යුෂ දිව්‍ය සත්ප්‍රසාද පිළිවෙතෙහි බාහිර සලකුණ වේ. (   )
17. යෙසායා දිවැසිවරයා ජේසුස් වහන්සේගේ උපත පිළිබඳ අනාවැකි ප්‍රකාශ කළ අයෙකි. (   )
18. සමගි සන්ධානයේ දේව ප්‍රසාද නිධානය තුළින් අපේ පව්වලට කමාව ලැබේ. (   )
19. ගීතාවලිය පංච පුස්තකයට අයත් ග්‍රන්ථයකි. (   )
20. රෝගීන්ගේ ආලේපය එක් වරක් පමණක් ලැබිය හැකි දේව ප්‍රසාද නිධානයකි. (   )

(ලකුණු 2X5=10)

Education NCP - www.edncp.lk

## II කොටස

- ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.

01. (i) පංච පුස්තකය හඳුන්වන වෙනත් නම් **තුනක්** ලියන්න. (ලකුණු 06)
    (ii) උත්පත්ති පොතේ ඇතුළත් කරුණු **තුනක්** ලියන්න. (ලකුණු 06)

02. (i) මිනිසා අන් මැවිලිවලට වඩා උසස් වීමට හේතු **තුනක්** ලියන්න. (ලකුණු 06)
    (ii) දෙවියන් වහන්සේ මැවිල්ල සම්බන්ධයෙන් මිනිසාට පැවරූ වගකීම් **තුනක්** ලියන්න. (ලකුණු 06)

03. (i) ප්‍රසාද ස්නාපනයේ දී භාවිත වන සංකේත **තුනක්** නම් කරන්න. (ලකුණු 06)
    (ii) ප්‍රසාද ස්නාපනයෙන් ලැබෙන වරප්‍රසාද **තුනක්** ලියන්න. (ලකුණු 06)

04. (i) සමගි සන්ධානයේ දේව ප්‍රසාද නිධානය නිසි ලෙස ලබා ගැනීමට අවශ්‍ය පියවර **තුනක්** ලියන්න. (ලකුණු 06)
    (ii) පාපයෙන් වැලකී වරප්‍රසාදී ජීවිතයක් ගත කිරීමට ඔබේ ජීවිතය තුළ ඇති කර ගත යුතු ගුණාංග **තුනක්** ලියන්න. (ලකුණු 06)

05. (i) පූජා ප්‍රසාදි තුමන්ලාගෙන් සිදුවන සේවාවන් **තුනක්** ලියන්න. (ලකුණු 06)

(ii) සබත් දවසේ දී අප විසින් **නොකළ** යුතු කාර්යයන් **තුනක්** ලියන්න. (ලකුණු 06)

06. (i) සහෝදර ප්‍රේමය පෙන්වා දෙන පනත් **තුනක්** ලියන්න. (ලකුණු 06)

(ii) අට වන දේව පනතට විරුද්ධ පාප **තුනක්** ලියන්න. (ලකුණු 06)

07. පහත සඳහන් මාතෘකා අතරින් **දෙකක්** තෝරාගෙන කෙටි සටහන් ලියන්න.
(එක් මාතෘකාවක් සඳහා වාක්‍ය **හයක්වත්** ඇතුළත් විය යුතුයි)

(i) ශු. දෙවන ජුවාම් පාවුලු මුනිතුමා

(ii) සේවය සඳහා ස්ථාපිත දේව ප්‍රසාද නිධාන

(iii) දෙමාපියන් වෙනුවෙන් දරුවන්ගේ යුතුකම් හා වගකීම්

(iv) ශුද්ධ බයිබලය

(ලකුණු 6X2=12)

***

Education NCP - www.edncp.lk

PAST PAPERS WIKI

LOL.lk
Learn Ordinary Level

# විභාග ඉලක්ක පහසුවෙන් ජයගන්න

## පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර






• Past Papers • Model Papers • Resource Books
for G.C.E O/L and A/L Exams

සමනල දැනුම
විභාග ඉලක්ක ජයගන්න Knowledge Bank
Master Guide

WWW.LOL.LK

CASH ON DELIVERY

HOME DELIVERY

Whatsapp contact
+94 71 777 4440

Website
www.lol.lk

Order via WhatsApp

# 071 777 4440